හැටන් - දික්ඔය නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 03 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව අගෝස්තු 19 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

නගර සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
----------------------------

ගිණුම් විෂයයන් 04ට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.62,252,871ක් වූ අතර, උපයෝගී ලේඛණ, අනුව එම ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.69,938,159ක් වූයෙන් රු.7,685,288ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
--------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.14,411,041 ක් වූ අතර ඒ තුළ අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.14,017,382ක් විය.

(ආ). ගෙවිය යුතු ගිණුම්
---------------------

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 04ක එකතුව රු.60,155,337ක් වූ අතර එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.57,081,803 ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති රු.6,820,426ක් වටිනා ගිණුම් විෂයයන් 02ක් ද්‍රව්‍ය ඇස්තමේන්තු සහ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකිවිය.

1.3.5 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි (i) 371 (5) වගන්තිය | 1990 සිට 2015 දක්වා අවස්ථා 90කදී ලබාදී තිබූ රු.4,893,813ක් වටිනා අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) 571 | 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 618කට අදාළ රු.6,073,453ක් වටිනා තැන්පතු නියාදනය කර නොතිබුණි. |
| (ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 46 දරන චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 2006 වර්ෂයෙන් පසු තක්සේරු කර බදු මුදල් ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,911,167ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,765,173ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,145,994ක වර්ධනයක් විය.

2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ජංගම අනුපාතය 1.3:1ක් ලෙස, ප්‍රශස්ථ මට්ටමට අඩුවෙන් පැවති අතර ජංගම වත්කම්වලින් සියයට 34ක් ආදායම් ණය ගැතියන්ගෙන් හා ජංගම වගකීම්වලින් සියයට 57ක් ණයහිමියන්ගෙන් සමන්විත විය.

2.3. ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.12.31 දිනට හිඟ 2015.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 2,616,427 | 1,227,468 | 7,182,298 | 5,982,763 | 1,388,959 | 1,199,535 | 2,588,494 |
| බදු කුලී | 3,983,773 | 2,584,626 | 14,754,640 | 13,347,828 | 1,399,147 | 1,766,812 | 3,165,959 |
| බලපත්‍ර ගාස්තු | 105,250 | 96,250 | 2,000,956 | 1,941,946 | 9,000 | 59,010 | 68,010 |

2.3.2 වරිපනම් බදු

(අ). වරිපනම් බදු අයකිරීම සඳහා සභාවේ දේපළ වසර 05කට වරක් තක්සේරු කළයුතු වුවත් 2006 වසරේ තක්සේරුව මත 2015 වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. නව දේපළ තක්සේරුව 2014 සැප්තැම්බර් වන විට සභාවට ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක නොකිරීම නිසා සභාවට විශාල ආදායමක් අහිමිවී තිබුණි.

(ආ). වර්ෂය අවසානයේදී පැවති හිඟ මුදල් රු.2,616,427ක් වූ අතර එම මුදලින් වර්ෂය තුළදී අයකරගෙන තිබුණේ සියයට 47ක් පමණක් විය. ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

2.3.3 බදු කුලී

(අ). හිඟ මස්කඩ කුලී

(i) සභාව සතු පොදු වෙළඳ පොල මස්කඩ 09කින් 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ කඩකුලී රු.555,421ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මෙම මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගතයුතු කාලසීමාව පසුවන තෙක් වගකිව යුතු නිලධාරීන් ඒ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) පොදු වෙළඳපොල අංක 13 දරන ගවමස් කඩ කාමරය 2015 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේදී සිදුවූ අක්‍රමිකතාව හේතුවෙන් වැඩිම මිල ඉදිරිපත්කර ප්‍රතික්ෂේප වූ ටෙන්ඩර්කරු සභාවට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණ අතර මෙම කඩකාමරය සඳහා පැමිණිලිකරු ඉදිරිපත් කරන ලද ටෙන්ඩරය 2014 අප්‍රේල් 07 සිට පිළිගන්නා ලෙස අධිකරණය නියෝගකර තිබුණි. එම නඩුව වෙනුවෙන් සභාව නඩු ගාස්තු ලෙස රු.250,000ක මුදලක් ගෙවා තිබූ අතර 2015 ජනවාරි - මාර්තු දක්වා රු.931,387ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) මාළු වෙළඳ කුටි කුලී.

(i) හැටන් නව වෙළඳපොල ඉදිරිපිට ඇති මාළු වෙළඳ කුටි 08ක් 2014 ජූලි 01 සිට 2015 ජූනි 30 දක්වා කාලයට බදුදී තිබුණි. මෙම කඩවලින් කුලී අයවීම ඉතාම දුර්වල තත්ත්වයක පැවති අතර, 2015 ජූනි 30 දිනට රු.442,661ක හිඟයක් පැවතුණි.

(ii) මෙම කඩ කාමරවල ටෙන්ඩර් කාලය 2015 ජූලි සිට අවසන් වී ඇති නමුත් සැප්තැම්බර් 25 දින දක්වා නැවත බදුදීමට කටයුතු කර නොතිබුණි.

මෙයින් කාමර 02ක මුදල් නොගෙවීම නිසා ටෙන්ඩර් අවලංගු කර වසා දමා තිබුණි. මේ හේතුවෙන් ජූනි 30 දක්වා සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ඇ) එම්.එච්.එස්.අබුසාලි ශාලාව බදුදීම.
--------------------------------------

2013 ඔක්තෝබර් 01 දින සිට වර්ෂ 03කට බදුදී තිබූ මෙම ශාලාව 2015 වර්ෂයේදී ආපසු භාරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.338,888ක් අයවිය යුතුව තිබුණි.

(ඈ) ඉඩම් බදු
----------

සභාව සතු ඉඩම් බදු දුන් දිනයන් අනාවරණය නොවූ අතර, වර්ෂ 05කට වරක් තක්සේරු කර බදු මුදල් ප්‍රතිශෝධනය කිරීමටද කටයුතු කර නොතිබුණි.

2.3.4 දැන්වීම් පුවරු ගාස්තු
------------------------

සභා බලප්‍රදේශයේ දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැසට්කර නොතිබූ නමුත් වාර්ෂිකව ගාස්තු අයකරන බවට ගැසට්කර තිබුණි. මෙය සභාවට විශාල ආදායමක් ලබාගත හැකි මාර්ගයක් වුවත් ඒ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අතර ඒ සම්බන්ධව පහත අඩුපාඩුද දක්නට ලැබුණි.

(අ). වර්ෂය ආරම්භයේ දැන්වීම් පුවරු සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර විධිමත්ව ලේඛන ගත කර නොතිබුණි.

(ආ). 2015 ජූනි 11 දින ආයතන 11කට දැන්වීම් පුවරු ගාස්තු ගෙවන ලෙස ලිපි යවා ඇතත්, අදාළ රු.404,024ක මුදල අයකරගෙන නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ රු.190,251ක් වටිනා උසාවි දඩ සහ රු.8,841,450ක් වටිනා මුද්දර ගාස්තු අයවී නොතිබුණි.

2. 4 අධිභාර
--------

නගර සභා ආඥාපනතේ (255වන අධිකාරය) 182(1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු. 29,692ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම
----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී රු.10,316,121ක් වූ නිකුත් කිරීම් වලට අදාළ වටිනාකම 2016 ජූනි වන විටද වැය ලෙජරයේ සටහන් කර නොතිබුණු අතර, මේ හේතුවෙන් වැය ලෙජර් පවත්වාගෙන යාමේ අරමුණ ඉටුවී නොතිබුණි.

(ආ).2015 වර්ෂයට අදාළව කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රයෝජනයට ගතනොහැකි භාණ්ඩ 800කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන තිබුණද, ඒවා වෙන්දේසි කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

2012 වර්ෂයට පෙර සිට සභා බලප්‍රදේශය තුළ එක්රැස් කරනු ලබන ඝණ අපද්‍රව්‍ය මහවැලි ගඟේ ජල පෝෂක ඇළ මාර්ග දෙකක් අතර පිහිටි භූමියකට බැහැර කිරීම හේතුවෙන් අදාළ ජල පෝෂක දූෂණයට ලක්ව තිබූ අතර විවෘත භූමිය තුළ ඝණ අපද්‍රව්‍ය පිළිස්සීමට ලක්කිරීම හේතුවෙන් පරිසරය දූෂණය වීමට හේතුවී තිබුණි. මේ හේතුවෙන් පීඩාවට පත් අවට ගම්වාසීන් විසින් මීට එරෙහිව හැටන් දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද විධිමත් කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයකට යොමු නොවී නොකඩවා එම ස්ථානයට කසළ බැහැරකරමින් තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 13 සිට සියයට 107 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 42සිට සියයට66 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 වත්කම් කළමණාකරණය

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

(අ). සභාව සතු රු.1,000,000ක් වටිනා මාර්ග තලනය හා රු.8,160ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

(ආ).භාණ්ඩ සමීක්ෂණයේදී ඉවත් කිරීමට නිර්දේශිත රු.154,830ක් වටිනා අබලි ද්‍රව්‍ය වර්ග 113ක් වෙන්දේසි කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය 2010 වර්ෂයේදී ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද වෙන්දේසි කටයුතු සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ආදායම් පරිපාලනය.

(ආ). වත්කම්වල කළමනාකරණය.

(ඇ). ණයගැති හා ණයහිමි පාලනය

(ඈ). තොග පාලනය.